සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Provincial Department of Education - NWP**

| | | |
|---|---|---|
| 7 ශ්‍රේණිය | පළමු වාර පරීක්ෂණය - 2019 | 50 S |

නම ...............................................

නාට්‍ය හා රංග කලාව I කොටස

**කාලය පැය දෙකයි**

**උපදෙස්**
- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**
- **නිවැරදි පිළිතුරට යටින් ඉරක් අඳින්න.**

01. නූතන රංග භූමිය හඳුන්වන්නේ ,

1. කරළිය 2. ප්‍රොසීනියම් වේදිකාව
3. තානායම්පොල 4. ග්ලෝබ් වේදිකාව

02. ආහාර්ය අභිනයට අයත් වේ.

1. රංග වස්ත්‍රාභරණ, සංගීතය, පසුතල නිර්මාණ 2. නළුවා, පසුතල නිර්මාණ, රංගභූමිය
3. සංවාද, සංගීතය, ආලෝකකරණය 4. වේෂභූෂණ, රංග භූමිය, අංග රචනය

03. "අමර ගියා දිව්‍ය ලෝකේ" නාට්‍ය පිටපත රචනා කරන ලද්දේ

1. සෝමලතා සුබසිංහ 2. එදිරිවීර සරච්චන්ද්‍ර
3. පාලිත ලොකුපෝතාගම 4. නන්දන අලගෙවත්ත

04. නාට්‍ය පිටපතක් ඇත්තේ,

1. කියවා රස විඳීම සඳහා ය.
2. අධ්‍යක්ෂවරයාගේ පහසුව සඳහා ය.
3. ජීවමාන නළු නිළියන් යොදාගෙන වේදිකාවක් මත රඟ දැක්වීම සඳහා ය.
4. තේරුම් ගැනීමට අපහසු තැන් පැහැදිලි කර ගැනීම සඳහා ය.

05. පංති කාමරයේදී අහඹු ලෙස පෙර සූදානමක් නොමැතිව චරිතයක් නිරූපණය කිරීමට අවස්ථාව ලබා දුන්නේ නම් එය හඳුන්වන්නේ,

1. අභිරූපනයක් ලෙස යි 2. චරිත නිරූපනයක් ලෙස යි
3. ක්ෂණික නිරූපනයක් ලෙස යි 4. සමාරෝපය ලෙස යි

- **නොගැළපෙන පිළිතුර යටින් ඉරක් අඳින්න.**

06. අනුශාංගික කලාව

1. ශෛලියට අනුව වෙනස් නොවේ. 2. ආලෝකකරණය, අංග රචනය, සංගීතය ආදියෙන් යුක්ත වේ.
3. නළුවාගේ රංගනයට උපකාරී වේ. 4. වේදිකාවට බැහැරින් ගෙන එනු ලබන දෑ වේ.

07. රංග භූමිවලට අයත් වේ.

1. තානායම්පොළ 2. යාග භූමිය
3. කරළිය 4. කුඹුර

08. ඔබ නාට්‍යමය සංවාදයක් උච්චාරණය කිරීමේදී සැලකිලිමත් විය යුතු කරුණු වන්නේ

1. රූප ස්වභාවය 2. නැවතීම්
3. විරාම 4. ප්‍රශ්නාර්ථ

09. කතාන්දරයක ලක්ෂණ වේ.

1. මුල, මැද, අග සහිතව ගොතා තිබීම 2. රූප මනසේ මවා ගත හැකි වීම
3. විවිධ චරිත දක්නට ලැබීම 4. සංවාද බහුලව යොදා ගැනීම

.

(ල. 2 x 10 = 20)

10. නූතන රංග භූමියක
    1. මනඃකල්පිත බෙදීම් 09 ක් ඇත    2. වෙස් අත්තක් ඇත
    3. ප්‍රේක්ෂකාගාරයක් ඇත    4. නේපත්‍යාගාරයක් ඇත

- **හිස්තැනට ගැළපෙන පිළිතුර කොටුව තුළින් තෝරා ලියන්න.**

| අවමංගල උත්සවය, කියවා හෝ අසා, එකම චරිතයක විවිධ පැතිකඩ, පණිවිඩයක්, නාට්‍යයක් |
|---|

11. ................................................................ රංග දැක්වීම භූමිකා වේ.

12. ............................................ සාමාන්‍ය ජීවිතයේ නාට්‍යෝචිතව රඟ දැක්විය හැකි අවස්ථාවකි.

13. කතාන්දරයක් ............................................. රස විඳිය හැක.

14. ................................................................ තුළින් ප්‍රේක්ෂකයාට ගැඹුරු ජීවිතාවබෝධයක් ලබා දිය හැක .

15. කතාවක් තුළින් යම් ................................................................ ප්‍රකාශ වීම තේමාව වේ.

- **හරි නම් (✓) ලකුණ ද වැරදි නම් (✗) ලකුණ ද යොදන්න.**

16. ඕනෑම කලා නිර්මාණයක තේමාවක් අන්තර්ගත නොවේ. (    )

17. සමාරෝපය කොටස් දෙකකින් යුක්ත ය. (    )

18. පරිකල්පනය නළුවකුට අවශ්‍ය නොවේ. (    )

19. කලාවේ මූලික අරමුණ රස වින්දනය වේ . (    )

20. සාමූහික බව නාට්‍ය කලාවේ මූලික ලක්ෂණය කි (    )

(එක් ප්‍රශ්නයකට ලකුණු 1 බැගින් ලකුණු 20)

## II කොටස

**පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. පළමු ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න දෙකකට පිළිතුරු සපයන්න. (මුළු ප්‍රශ්න තුනයි)**

01. i. රංග භූමියක් යනු කුමක් ද? . (ල. 2)

ii. රංග භූමියක තිබිය යුතු මූලික ලක්ෂණ 03 ක් දක්වන්න. (ල. 3)

iii. ඔබ ඉගෙන ගත් ගැමි නාට්‍ය රඟ දක්වන රංග භූමියක් ඇඳ එහි කොටස් නම් කරන්න . (ල. 5)

02. පංති කාමරයේදී ඔබේ ගුරුතුමිය ඔබව කණ්ඩායම් කොට සෙල්ලම් ගෙදරක් නිරූපනය කිරීමට අවස්ථාව සලස්වන්නට ඇත.

i. ඔබ කණ්ඩායමෙහි සිසුන් රඟ දැක්වූ චරිත මොනවා ද? (ල. 2)

ii. එම නිර්මාණය තුළ දක්නට ලැබුණු නාට්‍යමය ලක්ෂණ 03 ක් දක්වන්න. (ල. 3)

iii. එහිදී ඔබට ලැබුණු චරිතය නිරූපනය කිරීම සඳහා ඔබ සූදානම් වූ ආකාරය පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න . (ල. 5)

03. "අල්ලා, බන්දා, රන්දා, සින්දා, කැන්දා ......." ගීතය ඔබ, ඔබගේ ගුරුතුමා සමග ගායනා කරන්නට ඇත.

i. එම ගීතය ගායනා කළේ කුමන රංග අභ්‍යාසයක් ප්‍රගුණ කිරීම සඳහා ද? (ල. 2)

ii. ඔබ පංති කාමරයේදී සිදු කළ වෙනත් රංග අභ්‍යාස 3 ක් ලියන්න. (ල. 3)

iii. රංග අභ්‍යාස තුළින් ලැබෙන ප්‍රයෝජන පැහැදිලි කරන්න. (ල. 5)

04. 1. ශ්‍රී ලංකාව හා සම්බන්ධ ඓතිහාසික කතා ඇතුළත් ග්‍රන්ථ දෙකක් නම් කරන්න . (ලකුණු 2)

2. ඔබ දන්නා යෝධයන් හා සම්බන්ධ කතා 03 ක නම් ලියන්න. (ලකුණු 3)

3. වරහන් තුළ දී ඇත්තේ ඓතිහාසික කතා ඇසුරින් නිර්මාණය වූ චිත්‍රපට, ටෙලි නාට්‍යය හා වේදිකා නාට්‍යවල නම් කිහිපයකි. එය ඇසුරු කරගෙන පහත වගුව පුරවන්න.

(සිරි පැරකුම්, දෝන කතිරිනා, මහින්දාගමනය, මහතලා හටන, සුභ සහ යස, වීර පුරන් අප්පු, මොණරවිල, ගජමන් පුවත, සිරි දළදා ගමනය, කුවේණි, දෙවැනි මහින්ද, අබා, බෝගල සවුන්දිරිස්, සූරසරදියෙල්)

| වේදිකා නාට්‍යය | ටෙලි නාට්‍යය | චිත්‍රපට |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |

(ලකුණු 5)

05. ඔබ කැමති තේමාවක් නම් කර ඒ ඇසුරින් නාට්‍ය පිටපතක් රචනා කරන්න. (ලකුණු 10)

# පළමු වාර පරීක්ෂණය - 2019

# නාට්‍ය හා රංගකලාව - 7 ශ්‍රේණිය

## පිළිතුරු පත්‍රය

## I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 01. | iii | 06. | I | 11. | එකම චරිතයක විවිධ පැතිකඩ | 16. | ✗ |
| 02. | I | 07. | iV | 12. | අවමංගල උත්සවය | 17. | ✓ |
| 03. | ii | 08. | i | 13. | කියවා හෝ අසා | 18. | ✗ |
| 04. | iii | 09. | iV | 14. | නාට්‍යයක් | 19. | ✓ |
| 05. | ii | 10. | iii | 15. | පණිවිඩයක් | 20. | ✓ (ලකුණු 20) |

## II කොටස

01.

i. ඕනෑම රංගයක් ඉදිරිපත් කිරීම සඳහා භාවිතා වන ස්ථානය රංගභූමිය ලෙස හඳුන්වයි. (ලකුණු 2)

ii. ★ සමතලා භූමියක් විය යුතුයි.

★ රඟපෑමට ප්‍රමාණවත් අවකාශයක් තිබිය යුතුයි.

★ නළු නිළියන්ට අවශ්‍ය අවම පහසුකම් තිබිය යුතුයි.

★ ප්‍රේක්ෂක පිරිසකට පහසුවෙන් නැරඹිය හැකිවනසේ පිහිටා තිබීම ආදී වශයෙන් නිවැරදි පිළිතුරු ලියා ඇත්නම් ලකුණු ලබාදෙන්න. (ලකුණු 3)

iii. නිවැරදි රූප සටහනට ලකුණු දෙන්න. (ලකුණු 5)
(කමත, තානායම්පොල, කරලිය)

02.

i. නිවැරදි පිළිතුරු ලියා ඇත්නම් ලකුණු ලබාදෙන්න. (ලකුණු 2)

ii. අනුකරණය, සමාරෝපය, සංවාද භාවිතය, රංග වස්ත්‍ර භාවිතය ආදී පිළිතුරු සඳහා ලකුණු ලබා දෙන්න. (ලකුණු 3)

iii. නිවැරදි පිළිතුරට ලකුණු ලබා දෙන්න. (ලකුණු 5)

03.

i. හඬ අභ්‍යාස සඳහා (ලකුණු 2)

ii. ශ්වසන අභ්‍යාස
සංවේදන අභ්‍යාස
ශිථිලකරණ අභ්‍යාස ..... නිවැරදි පිළිතුරු සඳහා ලකුණු ලබාදෙන්න. (ලකුණු 3)

iii. ක්‍රියාශීලී බව, නම්‍යශීලී බව, සබකෝලය දුරුවීම, විවිධ හඬ පරාසයන් තුල දෙබස් උච්චාරණය කල හැකි වීම මානසික හා ශාරීරික සැහැල්ලුව තුලින් තම රංගනය මනාව ඉදිරිපත් කර ගැනීමට හැකි වීම........... ආදී කරුණු පැහැදිලි කර ඇත්නම් සම්පූර්ණ ලකුණු ලබා දෙන්න. (ලකුණු 5)

04.

i. මහා වංසය, දීප වංසය, රාජ රත්නාකරය, චූලවංසය. (ලකුණු 2)

ii. නන්දිමිත්‍ර යෝධයාගේ කතාව, ගෝඨයිම්බරට නම ලැබුණ හැටි, නීල මහා යෝධයාගේ කතාව ..... ආදී පිළිතුරු ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 3)

iii.

| වේදිකා නාට්‍යය | ටෙලි නාට්‍යය | චිත්‍රපට |
|---|---|---|
| දෝන කතිරිනා | මහතලා හටන | සිරි පැරකුම් |
| සුභ සහ යස | මොණරවිල | මහින්දාගමනය |
| ගජමන් පුවත | බෝගල සවුන්දිරිස් | වීර පුරන්අප්පු |
| කුවේණි | සුර සරදියෙල් | සිරි දළදාගමනය |
| දෙවැනි මහින්ද | දෝනකතිරිනා | අබා |

05. නාට්‍ය පිටපතට අනුව ලකුණු ලබාදෙන්න.

(ලකුණු 10)